ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය - I | කාලය පැය 01 යි |
|---|---|---|

**සැලකිය යුතුයි :-**
- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර හෝ වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. සිදුහත් බෝසත් කුමරුට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වූ බමුණු පඬිවරයා වූයේ,
1. කාලදේවල බමුණා 2. සර්වමිත්‍ර බමුණා 3. ද්‍රෝණ බමුණා 4. කොණ්ඩඤ්ඤ බමුණා

02. සිදුහත් බෝසත් කුමරුගේ ශාන්ත වූ ඉඳුරන් ඇතිව ගමන් විලාසය හා රූපශ්‍රීය දැක "මෙවන් පුතෙකු ලද මවක්, පියෙක් නිවුණෝ වෙති" යනාදි වශයෙන් ප්‍රකාශය කළේ?
1. උප්පලවණ්ණා විසිනි. 2. භද්දකච්චායනා විසිනි.
3. කිසාගෝතමී විසිනි. 4. පුණ්ණාදාසිය විසිනි.

03. සිදුහත් බෝසත් කුමරු මහාභිනිෂ්ක්‍රමනින් පසුව "කිං කුසල ගවේසී ව" සිටි සමයෙහි බෝසතුන්ට මුණ නොගැසුණු තවුසා වන්නේ,
1. උද්දකරාම පුත්ත 2. භග්ගව 3. ආලාරකාලාම 4. කාලදේවල

04. සිදුහත් කුමරු ස්වයංවර උත්සවයක් මඟින් සරණපාවා ගත් කුමරියගේ පියතුමා වූයේ,
1. බිම්බිසාර රජතුමා 2. උදේනි රජතුමා 3. කොසොල් රජතුමා 4. සුප්‍රබුද්ධ රජතුමා

05. සිදුහත් බෝසත් කුමරුගේ උපතක් සමඟ සිදු වූ අසිරිමත් සිදුවීමක් නොවන්නේ,
1. ආනාපානසති භාවනාව වැඩීම. 2. සිංහනාද පැවැත්වීම.
3. සිරිපා පිළිගැනීමට සත්පියුම් පිපීම. 4. උපත සිදු වූ විගස පියවර තැබීම.

06. සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වය අවබෝධ කරගැනීමෙන් පසු සිදු කරන ලද ප්‍රථම උදම් වැකිය වන්නේ,
1. "උත්තිට්ඨෙ නප්ප මජ්ජෙය්‍ය - ධම්මං සුචරිතං චරේ" යනුවෙනි.
2. "සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා" යනුවෙනි.
3. "අනේකජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං" යනුවෙනි.
4. "අග්ගෝ හමස්මි ලෝකස්ස - ජෙට්ඨෝ හමස්මි" ලෝකස්ස යනුවෙනි.

07. සකල ක්ලේශධර්මයන් දුරු කළ හෙයින් ද, රහසින්වත් පව් නොකළ හෙයින් ද සියලු පූජාවන් ලැබීමට සුදුසු වන හෙයින් ද බුදුරජාණන් වහන්සේ,
1. බුද්ධ නම් වන සේක. 2. සුගත නම් වන සේක.
3. අරහං නම් වන සේක. 4. ලෝකවිදූ නම් වන සේක.

08. බුදුබව පතන බෝසත් උතුමන් විසින් පිරිය යුතු උතුම් පිළිවෙත් හඳුන්වන්නේ,
1. දස සක්විතිවත් 2. දස පාරමිතා 3. දසපින් කිරියවත් 4. දසරාජ ධර්ම

09. ගිහියා විසින් දැහැමි ජීවන වෘත්තියක් ලෙස වෙළඳාම කිරීමේ දී, වසවිස, මත්පැන්, අවිආයුධ වැනි අදැහැමි වෙළඳාම්වලින් තොරව ක්‍රියා කරයි. එය හඳුන්වනු ලබන්නේ,
1. සම්මා දිට්ඨිය ලෙස ය. 2. සම්මා ආජීවය ලෙස ය.
3. සම්මා වායාමය ලෙස ය. 4. සම්මා කම්මන්ත ලෙස ය.

10. තම නිවසට පැමිණෙන ආගන්තුකයින්ට සැළකීමේ යුතුකම බුදුදහමෙහි හැඳින්වෙනුයේ,
1. අත්ථි බලි යනුවෙනි. 2. රාජ බලි යනුවෙනි.
3. දේවතා බලි යනුවෙනි. 4. ඥාති බලි යනුවෙනි.

11. "සමගියම යහපති" යන අදහස ඇතුළත් උතුම් වූ බුද්ධ වචනය වන්නේ,
1. සමවායෝ ඒව සාධු යනුයි. 2. චේතනාහං කම්මං වදාමි යනුයි.
3. සමග්ගාහෝථ මා විවදථ යනුයි. 4. සන්තුට්ඨී පරමං ධනං යනුයි.

12. පුද්ගලයා විසින් සිදු කරනු ලබන කුසලාකුසල කර්ම සිදු කරනුයේ තිදොරිනි. පහත සඳහන් කරුණු අතරින් 'මනෝකර්ම' ගණයට අයත් නොවන්නේ,
1. මිත්‍යා දෘෂ්ඨිය 2. අදත්ථා දානය 3. අභිධ්‍යාව 4. ව්‍යාපාදය

13. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දී දීඝජානු කෝලිය නම් සිටුපුත්‍රයාට මෙලොව දියුණුව සඳහා දේශනා කරන ලද කරුණු අතරින් අයවැය ගැන සැළකිලිමත්ව ධනය පරිහරණය කළ යුතු බව දක්වා ඇත්තේ,
1. ආරක්ඛ සම්පදා 2. උට්ඨාන සම්පදා 3. සමජීවිකතා 4. කළ්‍යාණ මිත්තතා

14. චූල්ල කම්ම විභංග සූත්‍රයේ දී තෝදෙය්‍ය පුත්‍ර සුභ නම් මානවකයාට දේශනා කළ පරිදි ගරු කළ යුත්තන්ට ගරු නොකරන, පිදිය යුත්තන්ට නොපුදන අධික මානයෙන් යුතු තැනැත්තා,
1. උසස් යැයි සම්මත කුළවල උපදී. 2. බොහෝ ආබාධ සහිතව උපදී.
3. පහත් යැයි සම්මත කුළවල උපදී. 4. යසස් නැතිව උපදී.

15. සිඟාල නම් ගෘහපතියාට බුදුරදුන් දේශනා කරන ලද සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ධනය විනාශ වීමට හේතු වන කරුණු අතරට අයත් නොවන කරුණක් වන්නේ,
1. පවිටු මිතුර ඇසුර 2. සමජ්ජාභිචරණය
3. අනලස්ව කල්ගෙවීම. 4. නැටුම්, ගැයුම්, වැයුම් වලට ලොල් වීම.

16. ආහාර ගැනීමේ දී පමණ දැන අනුභව කිරීම නිසා යහපත් ප්‍රතිඵල ලැබෙන බව භද්දාලි සූත්‍රයේ දැක්වේ. එහි සඳහන් යහපත් කරුණු අතරට අයත් නොවන කරුණක් වන්නේ,
1. නිදුක් බව 2. කාය බලය ලැබීම.
3. බුද්ධිමත්බව වැඩිවීම. 4. රෝගාබාධ අඩුවීම.

17. "යමෙකු පවිකම් කළොත් එයින් ඔහුම කෙලෙසෙන්නේ ය. පවිකම් නොකළොත් එයින් ඔහුම පිරිසිදු වන්නේ ය" යන අදහස ඇතුළත් ධම්මපද ගාථාවේ මුල්පද දෙක වන්නේ,
1. "අත්තනාව කතං පාපං - අත්තනා සං කිලිස්සති"
2. "නතං කම්මං කතං සාධු - යං කත්වා අනුකප්පති"
3. "තංච කම්මං කතං සාධු - යංකත්වා නානු කප්පති"
4. "උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්ම කාරිනෝ"

18. බුද්ධාදී ත්‍රිවිධ රත්නයේ ගුණ පිළිබඳව අවබෝධයෙන් යුතුව ඇති කරගන්නා වූ පැහැදීම බුදුදහමෙහි දැක්වෙන්නේ,
1. ආකාරවතී ශ්‍රද්ධාව නමිනි. 2. අමූලිකා ශ්‍රද්ධාව නමිනි.
3. ආගමික භක්තිය නමිනි. 4. බුද්ධාලම්බන ප්‍රීතිය නමිනි.

19. මහනුවර යුගය වන විට පිරිහී ගිය සම්බුද්ධ ශාසනය නැවත නඟා සිටුවීමට සඳහා අප්‍රමිත ධෛර්යයෙන් යුතුව කටයුතු කළ යතිවරයන් වහන්සේ වනුයේ,
1. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමිපාණෝ ය.
2. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිපාණෝ ය.
3. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිපාණෝ ය.
4. වාරියපොළ ශ්‍රී සුමංගල හිමිපාණෝ ය.

20. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් නොවන කරුණක් වන්නේ,
1. දේශීය විදේශීය ධර්ම ප්‍රචාරය 2. ශාසනික කටයුතු නැවත ආරම්භ කිරීම.
3. ත්‍රිපිටකයම අංග සම්පූර්ණ වීම. 4. අටලොස් නිකාය බිහිවීම.

21. මදක් උස් වූ ආසනයක හිඳගෙන කලවා දෙපසට විහිදුවා පාද පහළින් ඇති පද්මයක් වැනි පීඨයක් මත තබාගෙන සිටීම එම ආසනයේ ස්වභාවයි. එම බුද්ධාසනය හඳුන්වනු ලබන්නේ,
1. වීරාසනය 2. භද්‍රාසනය 3. බුද්ධාසනය 4. පද්මාසනය

22. පස්කම් සැපතින් නික්මීම, අනුන් නොනැසීම හා අනුන්ට හිංසා නොකිරීම යන සංකල්පනාවන්ගෙන් යුක්ත වීම,
1. සම්මා දිට්ඨි නම් වේ. 2. සම්මා ආජීව නම් වේ.
3. සම්මා කම්මන්ත නම් වේ. 4. සම්මා සංකප්ප නම් වේ.

23. අවිධිමත් ලෙස ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් පස් දෙනෙකු පිළිබඳ බෞද්ධ සාහිත්‍යයෙහි දැක්වේ. අනුන්ගේ අත් උදව් නැතිව නැගිටින්නට බැරි තරමට අධිකව ආහාර ගන්නා තැනැත්තා හඳුන්වන්නේ,
1. ආහාර හත්ථක 2. අලංසාටක 3. තත්ථාවට්ටක 4. කාකමාසක

24. සිඟාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි ගුරුවරයා විසින් ශිෂ්‍යයාට ඉටු කළ යුතු යුතුකම් ගණයට අයත් නොවන්නේ,
1. තම යහළු මිත්‍රාදීන්ට හඳුන්වා දීම. 2. පවින් වැළැක්වීම.
3. මැනවින් හික්මවීම. 4. මැනවින් ඉගැන්වීම.

25. "දානං සීලංච නෙක්ඛම්මං පඤ්ඤා විරියේන පංචමං" යන ගාථාවෙහි සඳහන් ධර්ම කරුණු හඳුන්වනු ලබන පොදු නාමය වන්නේ,
1. දසරාජ ධර්ම 2. දස පුණ්‍යක්‍රියා 3. දස අකුසල් 4. දස පාරමිතා

26. සිතෙහි පවතින නොසන්සුන්බව, විසිරුණු ගතිය, සෙළවෙන ගතිය හා කළ නොකළ වරද පිළිබඳ තැවෙන ස්වභාවය අකුසල සිතුවිලි වේ. නොසන්සුන් වූ සිත සිරගෙයක දුක් විඳින්නෙකු ලෙස සාමඤ්ඤඵල සූත්‍රයේ දක්වා ඇත. මෙය හඳුන්වන නීවරණ ධර්මය වනුයේ,
1. කාමච්ඡන්ද නීවරණය 2. ව්‍යාපාද නීවරණය
3. ථීනමිද්ධ නීවරණය 4. උද්ධච්ච කුක්කුච්ච නීවරණය

27. මහින්දාගමනයත් සමඟම ශ්‍රී ලාංකිකයන් ලැබූ දායාද ගණයට අයත් නොවන කරුණක් වන්නේ,
1. ශ්‍රී දන්තධාතූන් වහන්සේ ලැබීම. 2. අක්ෂර මාලාවක් ලැබීම.
3. භික්ෂු ශාසනය ලැබීම. 4. ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලැබීම.

28. බහු ජාතික, බහු ආගමික සමාජයක් තුළ අන්‍ය ආගම්වලට ගරු කරමින් ස්වකීය අනන්‍යතාවය තහවුරු කර ගනිමින් ජීවත්වීම හඳුන්වනු ලබන්නේ,
1. සහජීවනය ලෙස යි. 2. ජාත්‍යාලය ලෙස යි.
3. සමානාත්මතාව ලෙස යි. 4. සමජීවිකතා ලෙස යි.

29. සමාජයේ ජීවත් වීමේ දී බෞද්ධ සහජීවන ප්‍රතිපදාව වර්ධනය කර ගැනීමට උපකාරි වන සතර සංග්‍රහ වස්තු වනුයේ,
1. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා 2. දානය, ප්‍රිය වචනය, අර්ථචර්යාව, සමානාත්මතාව
3. ඡන්ද, ද්වේෂ, භය, මෝහ 4. ඡන්ද, චිත්ත, වීරිය, විමංසා

30. අනුන්ගේ දුක දැක තම හදවතේ ඇතිවෙන අනුකම්පා සහගත සිතුවිලි හඳුන්වන්නේ,
1. මෙත්තා ගුණය යි. 2. කරුණා ගුණය යි.
3. මුදිතා ගුණය යි. 4. උපේක්ඛා ගුණය යි.

31. බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතනාරාමයේ දී පස්වග තවුසන් හට දේශනා කරන්නට යෙදුන සූත්‍ර දේශනාවේ චතුරාර්ය සත්‍ය ධර්මය අන්තර්ගත වේ. එම පස්වග මහණුන් හට දේශනා කරන ලද සූත්‍ර දේශනාව වන්නේ,
1. දම්සක් පැවතුම් සූත්‍රය යි. 2. අනන්තලක්ඛණ සූත්‍රය යි.
3. ව්‍යග්ඝ පජ්ජ සූත්‍රය යි. 4. තේවිජ්ජ සූත්‍රය යි.

32. ගැටලු අවම කර ගනිමින් සාර්ථක ජීවිතයකට මඟ පෙන්වන ග්‍රන්ථයක් ලෙස බෞද්ධයාගේ අත් පොත ලෙස සැළකෙන ග්‍රන්ථය,
    1. ලෝවැඩ සඟරාව යි.
    2. සිරිත් මල්දම යි.
    3. සුභාෂිතය යි.
    4. ධම්මපදය යි.

33. ශ්‍රී ලාංකික කලාකරුවාගේ කලා කුසලතාවය මෙන්ම සන්නිවේදන හැකියාව ප්‍රකට කෙරෙන ඉතා අලංකාර අග්‍රගණ්‍ය කලා නිර්මාණයක් ලෙස සැළකෙන්නේ,
    1. චෛතියසරය යි.
    2. බෝධිසරය යි.
    3. පටිමාසරය යි.
    4. සඳකඩ පහණයි.

34. බෞද්ධ රාජ්‍ය පාලනය පිළිබඳව, පාලන ප්‍රතිපත්තියක් වන දස සක්විති ඇතුළත් වන සූත්‍රය වන්නේ,
    1. චක්කවත්ති සීහනාද සූත්‍රය යි.
    2. කාලාම සූත්‍රය යි.
    3. සිඟාලෝවාද සූත්‍රය යි.
    4. දම්සක් පැවතුම් සූත්‍රය යි.

35. යම් කාර්යයක් ආරම්භ කිරීමේ දී, ඉදිරිපත් වීමේ දී, නිරත වීමේ දී යන පියවර තුනේ දී නොපසුබස්නා බවින් කටයුතු කිරීම විස්තර වන්නේ,
    1. අධිෂ්ඨාන පාරමිතාවෙනි.
    2. වීර්ය පාරමිතාවෙනි.
    3. ප්‍රඥා පාරමිතාවෙනි.
    4. සත්‍ය පාරමිතාවෙනි.

36. ස්කන්ධ පංචකය හෙවත් නාම රූප හේතුකොටගෙන සලායතන ඇතිවන බව හේතුඵල දහමෙහි සඳහන් වේ. එම ආයතන හය වනුයේ,
    1. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, උපධි නම් වේ.
    2. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම නම් වේ.
    3. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස, ඉන්ද්‍රිය නම් වේ.
    4. චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන නම් වේ.

37. උට්ඨාන වීර්යයෙන් දැතේ මහන්සියෙන් දහඩිය වගුරුවා ධාර්මිකව සපයාගත් ධනය පරිභෝග කිරීමෙන් ලැබෙන සැපය හඳුන්වන්නේ,
    1. අත්ථිසුඛය යි.
    2. භෝග සුඛය යි.
    3. අනණ සුඛය යි.
    4. අපවජ්ජ සුඛය යි.

38. ත්‍රිශික්ෂාවේ සමාධි ශික්ෂාවට අයත් නොවන මාර්ග අංගයක් වන්නේ,
    1. සම්මා ආජීව යන්න යි.
    2. සම්මා වායාම යන්න යි.
    3. සම්මා සති යන්න යි.
    4. සම්මා සමාධි යන්න යි.

39. යම් පුද්ගලයෙකු උපත ලබන්නේ යස ඉසුරින් පිරුණු ස්ථානයක නම් පෙර භවයන් හීදී සිදු කරන ලද අකුසල කර්මයන්හි විපාක දීම බොහෝ විට වැළකී යයි. ලැබුණු උපත අකුසල කර්ම විපාක දීමට නොගැලපෙන පරිසරයක් බැවින් එවනි කර්ම විපාකදීමෙන් වළකී. මෙය හැඳින්වෙන්නේ,
    1. ගති සම්පත්තිය යි.
    2. උපධි සම්පත්තිය යි.
    3. කාල සම්පත්තිය යි.
    4. පයෝග සම්පත්තිය යි.

40. ගිලානෝපස්ථානය බුද්ධ චරිතයෙන් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවූ අවස්ථාවක් සඳහා නිදසුනක් වන්නේ,
    1. මට්ටකුණ්ඩලී කථා පුවත ය.
    2. සෝපාක කථා පුවත ය.
    3. රජ්ජුමාලා කථා පුවත ය.
    4. පූතිගත්තිස්ස කථා පුවත ය.

උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය - II | කාලය පැය 02 යි |
|---|---|---|

සැලකිය යුතුයි :-
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

01. (i) බුදුදහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක කුමක් ද?
(ii) බුදුදහමට අනුව දැක්වෙන දෙයාකාරවන රෝග මොනවා ද?
(iii) දඹදෙණි සාහිත්‍ය යුගයේ බිහි වූ සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න.
(iv) බුදුදහමට අනුව ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රඥා ශික්ෂාවේ අංග මොනවා ද?
(v) පුද්ගල චරිත හයෙන් දෙකක් නම් කරන්න.
(vi) ශ්‍රද්ධාවේ ප්‍රභේද දෙක මොනවා ද?
(vii) "නිබ්බානං පරමං සුඛං" යන්නෙහි අර්ථ දක්වන්න.
(viii) බෝසතාණන් වහන්සේ දාන පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය දැක්වෙන ජාතක කතා දෙකක් නම් කරන්න.
(ix) ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ සඳහන් මෙලොව දියුණුවට හේතුවන කරුණු හතරෙන් දෙකක් නම් කරන්න.
(x) පුස්තකාරූඪ සංගීතියේ ප්‍රතිඵල දෙකක් නම් කරන්න.

02. (i) මහින්දාගමනය සිදු වූ ආකාරය සැකෙවින් දක්වන්න.
(ii) බුදු දහමේ ව්‍යාප්තියට දෙවන පෑතිස් රජුගෙන් සිදු වූ මෙහෙය අගයන්න.
(iii) මහින්දාගමනයෙන් අප ලත් දායාද පිළිබඳ විස්තරයක් කරන්න.

03. (i) බුදුරදුන් පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථාන දෙකක් නම් කරන්න.
(ii) පරිසර සංරක්ෂණය වෙනුවෙන් බුදුරදුන් භික්ෂූන් අරභයා දේශනා කර ඇති කරුණු මොනවා ද?
(iii) පරිසරය රැකගැනීම සඳහා ඔබට දායක විය හැකි ආකාරය සැකෙවින් දක්වන්න.

04. (i) චතුරාර්ය සත්‍ය ධර්මයේ එන කරුණු දෙකක් නම් කරන්න.
(ii) ඉන් එක් කරුණක් පිළිබඳව විස්තරයක් කරන්න.
(iii) එදිනෙදා ජීවිතයේ දී ඇතිවන ගැටලු නිරාකරණය සඳහා චතුරාර්ය සත්‍ය ධර්මය ඉවහල් කරගත හැකි අයුරු ගෙන හැර දක්වන්න.

05. (i) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිළිස්සති" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.
(ii) එම ගාථාවේ තේරුම ලියන්න.
(iii) "ශිෂ්‍ය ජීවිතය සාර්ථක කරගැනීම සඳහා ධම්මපදය ඉවහල් කරගත හැකිය" සනාථ කරන්න.

06. (i) සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් ආකාරයට ගුරු හා සිසු පිරිසට වෙන් කර ඇති දිසාව කුමක් ද?
(ii) ගුරුවරුන්ගෙන් සිසුන්ටත් සිසුන්ගෙන් ගුරුවරුන්ටත් ඉටුවිය යුතු යුතුකම් නම් කරන්න.
(iii) ගිහි විනය ලෙස සැළකෙන සිඟාලෝවාද සූත්‍රයේ දක්වා ඇති ආකාරයට සමාජ සබඳතා මැනවින් පවත්වාගෙන යෑම සඳහා අන්‍යෝන්‍ය සුහදතාවය ගොඩනඟා ගැනීම සඳහා යුතුකම් ඉටුකිරීම තුළින් හැකියාව ලැබේ. මේ කියමන සනාථ කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකකට</u> කෙටි සටහන් ලියන්න.
(i) ධම්මපදය
(ii) ත්‍රිලක්ෂණය
(iii) කල්‍යාණ මිත්තතා
(iv) සප්ත අපරිහානි ධර්ම

**පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)**
**11 ශ්‍රේණිය**
**බුද්ධ ධර්මය I – II (පිළිතුරු පත්‍රය)**

*1- පත්‍රය.*

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 11 - 1 | 21 - 2 | 31 - 1 |
| 2 - 3 | 12 - 2 | 22 - 2 | 32 - 4 |
| 3 - 4 | 13 - 3 | 23 - 1 | 33 - 4 |
| 4 - 4 | 14 - 3 | 24 - 2 | 34 - 1 |
| 5 - 1 | 15 - 3 | 25 - 4 | 35 - 2 |
| 6 - 3 | 16 - 3 | 26 - 4 | 36 - 4 |
| 7 - 3 | 17 - 1 | 27 - 1 | 37 - 2 |
| 8 - 2 | 18 - 1 | 28 - 1 | 38 - 1 |
| 9 - 4 | 19 - 1 | 29 - 2 | 39 - **1** |
| 10 - 1 | 20 - 4 | 30 - 2 | 40 - 4 |

*II පත්‍රය*

- ***පළමු ප්‍රශ්නයට ලකුණු 2 x 10 = 20 කි.***
- ***2 සිට 6 දක්වා ප්‍රශ්නවල 1, 2, 3 යන කොටස්වලට 2, 3, 5 බැගින් ලකුණු 10 කි.***
- ***7 වන ප්‍රශ්නය සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 5 බැගින් කොටස් 02 ට ලකුණු 10 කි.***

01. (i) සමථ භාවනාව / විදර්ශනා භාවනාව
(ii) කායික රෝග / මානසික රෝග
(iii) පූජාවලිය / සද්ධර්මරත්නාවලිය / දහම් සරණ / සඟසරණ / කව්සිළුමිණ
(iv) සම්මා දිට්ඨි / සම්මා සංකප්ප
(v) රාග චරිත / ද්වේෂ චරිත / මෝහ චරිත / ශ්‍රද්ධා චරිත / බුද්ධි චරිත / විතර්ක චරිත
(vi) අමූලිකා ශ්‍රද්ධාව / අකාරවතී ශ්‍රද්ධාව
(vii) නිවන උතුම් සැපයයි.
(viii) වෙස්සන්තර ජාතකය / සිවි ජාතකය / සස ජාතකය
(ix) උට්ඨාන සම්පදා / ආරක්ඛ සම්පදා / කළ්‍යාණ මිත්තතා / සමජීවිකතා
(x) • ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.
• පර්යාප්තිය හෙවත් ත්‍රිපිටක බුද්ධ වචනය ආරක්ෂා කර ගැනීමට මුල්තැන දිය යුතුය යන ආකල්පය සමාජගත වීම.
• පසුකාලීන ථේරවාදී බුදුදහම අභාවයට ගිය අවස්ථාවල දී නැවත ස්ථාපිත කිරීමට මෙම ග්‍රන්ථ උපකාරී වීම.
• ලෝකයේ වෙනත් රටවල ථේරවාදී බුදුදහම අභාවයට ගිය අවස්ථාවල දී නැවත ස්ථාපිත කිරීමට සුරක්ෂිතව පැවති ලාංකේය ධර්ම ග්‍රන්ථ උපකාරී වීම.
• බුදුදහම ව්‍යාප්ත නොවූ බටහිර රටවල පසුකාලයේ ඒ පිළිබඳ දැනුම බෙදා හැරීමට මෙම ග්‍රන්ථ උපකාරී වීම.
• එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම පිහිටුවීම හා පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කොට බෙදා හැරීමට හැකිවීම.

02. (i) මහින්දාගමනය සිදු වූයේ සම්බුද්ධ පරිනිර්වානයෙන් 236 වන වසරෙහි ය. දෙවන පැතිස් රජතුමාගේ පළමු රාජ්‍ය වර්ෂයේ හෙවත් ධර්මාශෝක අධිරාජයාගේ දහ අටවන (18) වන රාජ්‍ය වර්ෂයේ බව සැලකේ.

(ii) • ථේරවාදි බෞද්ධ මූලස්ථානය වූ මහා විහාරය මහමෙව්නාවේ පිහිටුවීම හා එම ආදර්ශය යටතේ අනුක්‍රමයෙන් ලක්දිව සියලු ගම් නියම්ගම් වල වෙහෙර විහාර ඉදිවීම.
• අරිට්ඨ කුමරු හා කුළ කුමාරවරු 500 ක් පැවිදි කරමින් දේශීය භික්ෂු ශාසනය ආරම්භ කිරීම.
• මහා විහාරය කේන්ද්‍රකොට ගත් ජාතික අධ්‍යාපන ක්‍රියාවලිය ආරම්භ වීම.
• සංඝමිත්තා තෙරණියගේ වැඩම වීම හා බෝධීන් වහන්සේ වැඩමවා රෝපණය කිරීම.
• අනුලා බිසව ඇතුළු කාන්තාවන්ට පැවිද්ද ලබා දී මෙහෙණි සස්න ඇරඹීම.
• බෞද්ධ කලා නිර්මාණ බිහිවීම.
• බෞද්ධ ජන ජීවිතයට ආවේණික පුදසිරිත් පද්ධතියක් බිහිවීම.
• බෞද්ධ ආර්ථික දේශපාලනික සංස්කෘතික ප්‍රතිපත්ති බිහිවීම.

(iii) මහින්දාගමනයෙන් පසුව ලංකාවේ බෞද්ධ සංස්කෘතියේ සමාරම්භය සිදුවීම හේතුවෙන් ථේරවාදි බුදුදහම හා එයින් ලැබූ ආලෝකය නිසා භාෂාව, සාහිත්‍යය, අධ්‍යාපනය, කලාශිල්ප, ආර්ථික හා දේශපාලන පිළිවෙත් සාරධර්ම හා පුදසිරිත් ආදිය අපට ලැබුණු දායාද වේ.

11 ශ්‍රේණිය බුද්ධ ධර්මය පෙළ පොත (17) පාඩම 118 පිටුවේ සිට
සමස්ථය සලකා බලා ලකුණු ලබා දෙන්න.

03. (i)

| | | |
|---|---|---|
| පළමු වස් කාලය | - | බරණැස ඉසිපතනාරාමය මිගදාය |
| දෙවන පතෙවන හා සිව් වැනි වස් කාලය | - | වේළුවනාරාමය |
| පස්වන වස් කාලය | - | විශාලා මහනුවර කූටාගාර ලෙන |
| හයවන පළමු වස් කාලය | - | මකුල පර්වතයෙහි |
| අටවන වස් කාලය | - | භේෂකලා පර්වතයෙහි |
| දහවන වස් කාලය | - | පාරිලෙයසස වනය |
| 13 – 18 – 19 වස්කාලය | - | චාලිය පර්වතය |

(ii) • නිල්තණ පිඩලි මත වමනය දැමීම, මල මූත්‍රා කිරීම, ඉඳුල් දැමීම නොකළ යුතු බව.
• ලිං පොකුණු තැනීම, මල්වතු උයන් වැවීම, ඒ දඬු පාලම් ඉදි කිරීම, දිවා රාත්‍රී පිං වැඩෙන ක්‍රියා ලෙස හැඳින්වීම.
• උපසපත් භික්ෂූන්ට ශික්ෂාවන් පැනවීම.. ආදි වශයෙන්

(iii) • ජල දූෂණය - වායු දූෂණය - ශබ්ද දූෂණය ආදියෙන් වැළකීම ආදි කරුණු
10 ශ්‍රේණිය - 16 පාඩම - 68 පිටුව සිට උපයෝගි කර ගන්න.
සමස්ථය සලකා බලා ලකුණු ලබා දෙන්න.

04. (i) දුක්ඛ ආර්ය සත්‍ය / දුක්ඛ සමුදය ආර්ය සත්‍යය / දුක්ඛ නිරෝධාර්ය සත්‍යය / දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍ය
(ii) - (iii) ප්‍රශ්න සඳහා 10 ශ්‍රේණියේ බුද්ධ ධර්මය පෙළ පොතෙහි 15 වන පාඩම 82 පිටුවේ පිළිතුරු ඇත.
සමස්ථය සලකා බලා ලකුණු ලබා දෙන්න.

05. (i)

| | | |
|---|---|---|
| අත්තනාව කතං පාපං | - | අත්තනා සංකිළිස්සති |
| අත්තනා අකතං පාපං | - | අත්තනාව විසුජ්ඣති |
| සුද්ධි අසුද්ධි පච්චත්තං | - | නාඤ්ඤමඤ්ඤෝ විසෝධයේ |

(ii) යමෙකු පව් කළොත් ඔහුම කෙළෙසෙන්නේ ය. යමෙකු පව් නොකළොත් ඔහුම එයින් පිරිසිදු වන්නේ ය. පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිම ය. එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැක.

(iii) සමස්ථය සලකා බලා ලකුණු ලබා දෙන්න.
11 ශ්‍රේණිය 06 වන පාඩම 49 පිටුව

06. (i) දකුණු දිශාව

(ii)

| <u>ගුරුභවතුන්ගෙන් සිසුන්ට</u> | <u>සිසුන්ගෙන් ගුරුවරුන්ට</u> |
|---|---|
| 1. මැනවින් හික්මවීම. | 1. දුටුවිට හුස්නෙන් නැගිටීම. |
| 2. මැනවින් ඉගැන්වීම | 2. අවශ්‍ය උපස්ථාන කිරීම. |
| 3. දන්නා සියලු ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම. | 3. අවවාද අනුශාසනාවලට මැනවින් ඇහුම්කම් දීම. |
| 4. තම මිත්‍රයින්ට ශිෂ්‍යයා හඳුන්වාදීම. | 4. අවශ්‍ය කටයුතු ඉටුකර දීම. |
| 5. ශිෂ්‍යයා ආරක්ෂා කර ගැනීම. | 5. මැනවින් ඉගෙන ගැනීම. |

(iii) ලියා ඇති පළිතුරුවල සමස්ථය බලා ලකුණු ලබා දෙන්න.
10 ශ්‍රේණිය 09 පාඩම 50 පිටුව

07. (i) බෞද්ධයාගේ අත්පොත ලෙස සැළකේ. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයකි. බෞද්ධයන් අතර ජනප්‍රිය කෘතියක් වන මෙය විශව භාෂා ගණනාවකට ද පරිවර්තනය කර ඇත. මෙහි වග්ග 26 කි. ගාථා 423 කි. නිධාන කථා 299 කි. මෙයත් තුන් කාලයටම ජීවිතාදර්ශ ලබාගත හැකි ඉතා වටිනා ග්‍රන්ථයකි.
(11 ශ්‍රේණියේ 06 පිඩම 49 පිටුව බලන්න.)

(ii) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම

- අනිත්‍ය යනු නිත්‍ය නොවන අස්ථිර ස්වභාවයයි. ස්කන්ධයන් නිත්‍ය යැයි අප සිතනා බැවින් එය නිත්‍ය නොවන හෙයින් දුක් සහිත ය.
- දුක්ඛ යනු නිසරු පිළිකුල් කටයුතු යන අදහසයි. ස්කන්ධයන් මොහොතක් මොහොතක් පාසා වෙනස්වන බැවින් ඒවා දුක් සහිත ය.
- අනාත්ම යනු මගේය අපේය යන හැඟීමෙන් දැඩිව අල්වා ගැනීමෙන් මමත්වය හට ගනී. මගේ අපේ යන හැඟීමෙන් දැඩිව අල්වා ගත්ත ද ආත්මීය වශයෙන් ගත යුත්තක් නොමැති නිසා අනාත්ම නම් වේ.

(10 ශ්‍රේණිය 05 පාඩම 31 පිටුව උපයෝගි කර ගන්න.)

(iii) කල්‍යාණ මිත්තතා යනු යහපත් මිතුරන් ය. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දී මෙලොව දියුණු වීමට හේතු වන තුන්වන කරුණ ලෙස දක්වා ඇත. කල්‍යාණ මිතුරන් 04 දෙනෙකි. උපකාරක, සමානසුඛදුක්ඛ, අත්ථක්ඛායි, අනුකම්පක යනුවෙනි. සිඟාලෝවාද සූත්‍රයේ දී උතුරු දිසාව මඟින් දක්වා ඇත්තේ ද මිත්‍ර මිත්‍ර යුතුකම් ය.
(සමස්ථය සලකා බලා ලකුණු ලබා දෙන්න.)

(iv) මෙය බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්තියකි. වජ්ජි රාජ්‍ය තුළ පාලන කටයුතු කරගෙන ගිය බව සැළකේ. ඒවා නම්,

1. නිතර නිතර රැස්වීම.
2. සමඟිව රැස්ව සමගිව සාකච්ඡා කොට සමගිව විසිරයාම.
3. පෙර නොපැන වූ නීති නොපැනවීම. පනවන ලද නීති කඩ නොකොට ආරක්ෂා කිරීම.
4. වැඩිහිටියන්ට හා ඔවුන්ගේ අදහස්වලට ගරු කිරීම.
5. කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම.

6. වජ්ජි රාජ්‍ය ඇතුළත හා පිටත පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම හා කඩනොකොට පුද සිරිත් පැවැත්වීම.
7. තම රාජ්‍යයට පැමිණි හා පැමිණෙන පූජනීය උතුමන්ට පහසුකම් සැළසීම.
සමස්ථය සළකා බලා ලකුණු ලබා දෙන්න.



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
GUIDE
PAST PAPERS
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
G.C.E. O/L
සිංහල
A9+
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440